**2022 සැපතැම්බර් මස16 වන දින පැවති**

**පනස් තෙවන මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව**

**දිනය :-2022.09.16**

**ස්ථානය :- නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**

**වේලාව :- පෙ.ව 10.00**

**සහභාගී වූ :-**

| | | | |
|---|---|---|---|
| 01. | ගරු සභාපති | එස්.බී කුමාරදාස මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 02. | ගරු උප සභාපති | එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ). |
| 03. | ගරු මන්ත්‍රී | බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 04. | ගරු මන්ත්‍රී | කේ.ඒ ශාන්ත මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 05. | ගරු මන්ත්‍රී | ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 06. | ගරු මන්ත්‍රී | ජේ.ඒ ජයවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 07. | ගරු මන්ත්‍රී | බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 08. | ගරු මන්ත්‍රී | පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 09. | ගරු මන්ත්‍රී | ඩී.පී බන්දුලසේන මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| 10. | ගරු මන්ත්‍රී | පී කරුණාරත්න මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| 11. | ගරු මන්ත්‍රී | ආර්.එම් කුමාරසිංහ මැතිතුමා | ( එ.ජා.ප) |
| 12. | ගරු මන්ත්‍රී | ඩී.එම්.එන් සුභාෂිණි බංඩාර මැ.තිනිය | ( එ.ජා.ප) |
| 13. | ගරු මන්ත්‍රී | එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා | ( එ.ජා.ප) |
| 14. | ගරු මන්ත්‍රී | ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිනිය | ( එ.ජා.ප) |
| 15. | ගරු මන්ත්‍රී | එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා | ( ජ.වි.පෙ) |

**දන්වා සහභාගී නොවූ:-**

| | | | |
|---|---|---|---|
| 16. | ගරු මන්ත්‍රී | එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ |
| 17. | ගරු මන්ත්‍රී | කේ.ඒ සංජීව මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 18. | ගරු මන්ත්‍රී | පී.ටී සිරිසේන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 19. | ගරු මන්ත්‍රී | ජී.ඒ නෙළුම් මැතිනිය | ( එ.ජා.ප) |
| 20. | ගරු මන්ත්‍රී | කේ. හැරිසෙන්ස් මැතිතුමා | ( ජ.වි.පෙ) |
| 21. | ගරු මන්ත්‍රී | වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා | (ස්වාධීන කණ්ඩායම) |

**නිළධාරීන්:-**

| | | |
|---|---|---|
| 01. | ලේකම් | රේණුකා ලියනගේ මිය |
| 02. | විෂය භාර කළමණාකරන සේවා නිළධාරී | කේ.ජී.ඒ සම්මානි මෙය |
| 03. | | |

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත සුභ උදැසනක් ප්‍රාර්ථනය කරමින්, ඉතාම ආදරයෙන් ගෞරවයෙන් පිළිගනිමින් න්‍යායපත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**අ) මහ සභා වාර්ථාව සභා සම්මත කර ගැනීම.**

**2022.08.19 වන දින මහ සභා කෙටුම්පත් වාර්ථාව**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2022.08.19 දින පැවැත් වූ මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව ප්‍රාදේශීය සභා රීතීන්ට අනුව ඔබ වෙත ලැබීමට සළස්වා ඇති බැවින් එම වාර්ථාවේ අඩුපාඩු ඇත්නම්

සංශෝධනයන්ට යටත්ව සහා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරමින් 2022.08.19 මහ සභා කෙටුම්පත් රැස්වීම් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සහා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>සංශෝධන</u>

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> පසුගිය සභා වාර්තාවේ උපකාරක පන්ති නියාමනය පිළිබඳව තමා ඉදිරිපත් කළ ප්‍රකාශයේ, වර්තමානය උපකාරක පන්ති තුළ අයථා ලෙස මුදල් අයකර ගැනීම පිළිබඳව, එකම ගුරුවරයකු විසින් විෂයන් කිහිපයක් උගන්වමින් සිසුන්ගෙන් මුදල් අය කර ගැනීමේ උපකාරක පන්ති කඩ පවතින බව අන්තර්ගත වී නොමැති බවත්, කණ්ඩායම් උපකාරක පන්ති තුළ "සිටිය යුතු අවම සිසුන් ප්‍රමාණය " නොව " සිටිය යුතු උපරිම සිසුන් ප්‍රමාණය " ලෙසට සංශෝධනය විය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> ඉදිරිපත් වූ සංශෝධනයන්ට යටත්ව 2022.087.19 වන දින පැවති මහ සභාවේ වාර්ථාව සංශෝධන වලට යටත්ව සහා සම්මත කිරීම සුදුස බවට ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022.087.19 වන දින මහ සභා රුස්වීම් කෙටුම්පත් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සහා සම්මත විය.

**අ) සභාපතිතුමන් විසින් කරනු ලබන විශේෂ නිවේදනය**

**01 ලේකම් තනතුරේ රාජකාරිය ඉටු කිරීම සඳහා පත්කිරීම.**

දැනට පුරප්පාඩුව පවතින නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ ලේකම් තනතුර සඳහා නිත්‍ය නිලධාරියකු පත් කරන තෙක් හෝ නැවත නියාමනයක් කරන තුරු උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් ගේ ආවරණ අනුමැතියට යටත්ව, වර්තමානයේ තිරප්පනය ප්‍රාදේශීය සභාවේ ලේකම් තනතුරේ රාජකාරි ඉටුකරන ආර්. පී.පී ලියනගේ මිය සතියට දින දෙකක් ලේකම් තනතුරේ රාජකාරිය ඉටු කිරීම සඳහා පත් කළ බව ප්‍රකාශ කරන ලදී.

**ආ) ප්‍රාදේශීය සභාව වෙත අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි සහ සන්නිවේදන**

01.**ග්‍රැෆික් ඩිසයින් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (2022 පළමු කණ්ඩායම බඳවා ගැනීම)**

පළාත් පාලන ආයතන වල ගරු මහජන නියෝජිතයින් සහ නිලධාරීන්ට පරිගණක දැනුම ලබා දීම සහ එම දැනුම යාවත්කාලීන කිරීමේ අරමුණින් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ තොරතුරු තාක්ෂණ අංශය 2022 වසර සඳහා මෙම පාඨමාලාව පැවැත්වීමට සැලසුම් කර ඇති බවත්, මෙම පළමු කණ්ඩායමේ පන්ති 2022 වසරේ සිට, සෑම සතියකම අඟහරුවාදා දින, පෙරවරු 9.00 සිට පස්වරු 4.00 දක්වා පවත්වන බවත්, මෙහි පාඨමාලා ගාස්තුව රුපියල් හතලිස් දාහක් බවත්, මේ සඳහා සහභාගී වීමට අවශ්‍ය නම් මෙහි ඇති අයදුම්පත්‍රය නිසිලෙස සම්පූර්ණ කර " අධ්‍යක්ෂක පළාත් පාලන ආයතනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය, නොම්බර 17, මල්ලසේකර මාවත, කොළඹ 7" යන ලිපිනයට තැපැල මගින් හෝ ict@slilg.gov.lk යන ඊමේල් ලිපිනයට එවිය යුතු බවත්, වැඩි විස්තර දැනගැනීම සඳහා 077-3020134 යන දුරකථන අංකයෙන් වට්ස් ඇප් මගින් විමසන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

**02.නිවාස ඉදිකරගැනීම සඳහා උපකාර ඉල්ලා සිටීම.**

ශ්‍රාවස්තිපුර, 5 ඇළ පාර, වදාකඩ, ලිපිනයේ පදිංචි එච්.ඩී.ඒකනායක මහතා මෙම ඉල්ලීම යොමු කොට ඇති බවත්, ඔහු දරුවන් හතර දෙනකුගේ මවක් බවත්, ඇයගේ ස්වාමිපුරුෂයා කුලී පදනම මත කොන්ඩ සැපයීමේ ආයතනයක සේවකයෙක් ලෙස සේවය කරන බවත්, දැඩි ආර්ථික අපහසුතා මත ඔවුන් ජීවත් වන බවත්, ඔවුන් සතු ඉඩමෙහි කාමර දෙකක් සහ කුස්සියක් සකස් කිරීම සඳහා අඩිතාලම යොදා ඇති බවත්, දැනට කුලී

නිවසක කුලී පදනම මත ජීවත් වන බවත්, ඔවුන්ගේ එම නිවසින් ලබන මස 30 දින වන විට ඉවත් වීමට පවසා ඇති බවත්, එම නිසා ඔවුන්ගේ නිවස ඉදිකර ගැනීමට ඇස්බැස්ටෝ සෙවිලි තහඩු 20ක් හා සිමෙන්ති මිටි 20 ක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

**03.නෙල්ලිකුලම ප්‍රධාන මාර්ගය සහ වැව වැවපාර සංවර්ධන කටයුතු සඳහා වාහන පහසුකම් ලබා ගැනීම.**

නෙල්ලිකුලම ප්‍රධාන මාර්ගය සහ වැව වැවපාර ඉතා අබලන් තත්වයේ පවතින බවත්, පවතින වලවල් ගොඩ කර ගැනීම සඳහා ගම්වාසීන් විසින් ශ්‍රමදානයක් මගින් ශ්‍රමය සැපයීමට තීරණය කර ඇති බවත්, වලවල් ගොඩ කිරීමට අවශ්‍ය පස් ලබාගැනීමට ප්‍රදේශයේ ඉදි කර ඇති ලිං වලින් ඉවත ලන පස් යොදා ගන්නා බවත්, නමුත් ඒ සඳහා අවශ්‍ය JCB යන්ත්‍රයක් සහ ට්‍රැක්ටරයක් ලබා ගැනීම අවශ්‍ය බවත් ඒ සඳහා එම වාහන දෙක ලබා දීමට අවශ්‍ය කටයුතු කර දෙන මෙන් ඉල්ලා සිටින බවත්, එම මාර්ගවල වන අලි ගැටලුව බහුලව පවතින නිසා රාත්‍රී කාලයේ ධීවර කටයුතු වල යෙදෙන ධීවරයෙන් හට මෙම ගැටලුවට මුහුණදීමට සිදුවන බැවින් වීදි ලාම්පු හතරක් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ට ඉල්ලා සිටින බවත් ප්‍රකාශ කරන ලදී.

**04.සනිපාරක්ශක වැසිකිලියක් ලබා ගැනීම සඳහා.**

ගල්කුලම,පොනිමාන්කුලම පදිංචි ආර්.ජී.සිරිසේන යන අය මේ වන විට භාවිතා කරන වැසිකිලිය ඉතා අබලන් තත්වයේ පවතින බවත්, නව වැසිකිළියක් ඉදි කර ගැනීම සඳහා ආධාරයක් ලබා දෙන ලෙසටත් ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී.

**ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

**නැත.**

**ඉ) යථා පරිදී කල් දී ඇති යෝජනා**

**01. 2022 ඔක්තෝබර් මස සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2022 ඔක්තෝබර් මසට අදාලව කාර්යය මණ්ඩලය විසින් අතිකාල ඉල්ලීම් කර ඇති අතිකාල තක්සේරු වාර්ථා සභාවට ඉදිරිපත් කරමින් අදාල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

| **2022 ඔක්තෝබර්** | | පැය ගණන |
|---|---|---|
| 01. අයි.ජී.සී.එන් වීරකෝන් මිය | (කළ.සේවා නිළධාරී) | 40 |
| 02. එස්.එම් මහරගෙදර මිය | (සහකාර ගිණුම් නිළධාරී) | 40 |
| 03. එම්.එස්.එම් ගුණවර්ධන මිය | (කළ: සේවා නිළධාරී) | 40 |
| 04. කේ.ජී.ඒ සම්මානි මෙය | (කළ.සේවා නිළධාරී) | 40 |
| 05. එම්.ඒ.දිසානායක මිය | (කළ.සේවා නිළධාරී) | 40 |
| 06. ඩී.යූ.දිසානායක මයා | (කළ.සේවා නිළධාරී) | 40 |
| 07. කුමුදු වාසනා වීරසිංහ මිය | (කළ සහකාර (ආවරණ) | 40 |
| 08. ටී.එච්.ආර් තාරක මයා | (කළ සහකාර (ආවරණ) | 40 |
| 09. ඒ.ඒ පියතිස්ස මයා | (මං.කම්කරු (මුරකරු ආවරණ) | 40 |
| 10. ඩබ්.එස්.එස්.ඒ.පෙරේරා | (රියදුරු) | 75 |
| 11. ඩී.එම්.ගුණරත්න බංඩා | ( වැඩ පරිපාලක) | 40 |
| 12. ටී.එච්.ඩී.ඩී පෙරේරා මයා | (මුරකරු(ආවරණ) | 40 |
| 13. එම් ආර්.පෙරේරා මයා | (මුරකරු) | 75 |
| 14. බන්දුල දිසානායක | (මුරකරු ආවරණ) | 40 |
| 15. එස්.අන්තෝනි | (මුරකරු) | 75 |
| 16. චමින්ද කුමාර | (මුරකරු) | 75 |
| 17. කේ.නයනානන්ද | (ජල පෙරණ නෙළුබෑව) | 40 |

ගරු උප සභාපති එම්.සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා 2022 ඔක්තෝබර් මසට අදාල අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති තුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.
ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීමේ යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතීද යන්න විමසූ අතර කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොවූ බැවින් 2022 ඔක්තෝබර් මස අතිකාල ඉල්ලුම්කල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**02. පෞද්ගලික අධ්‍යාපන ආයතන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා පෞද්ගලික අධ්‍යාපන ආයතන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව මන්ත්‍රී වරුන් හට මාර්ගගත ක්‍රමය තුලින් ලැබීමට සැලැස් වූ බවත් අනෙක් මන්ත්‍රී වරුන් හට මෙම අවශ්ථාවේ කියවීමට ඉදිරිපත් කල බවත් එය අනුමත කිරීම සුදුසු බවත් යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා වර්තමානයේ උපකාරක පන්ති පැවැත්වීමේදී ඉඩකට පහසුකම් සැලකිල්ලට ගෙන නිවාස තුල ද උපකාරක පංති පවත්වාගෙන යන බවත් නමුත් මෙම අතුරු ව්‍යවස්ථාවට අනුව එය සිදු කළ නොහැකි අතර ඒ සඳහා අවධානය යොමුකර තීරණ ගත යුතු බවත්, ඉතා අත්‍යවශ්‍ය කාරණා එම අතුරු ව්‍යවස්ථාව අන්තර්ගත වී නොමැති බවත්, ඒවානම්, දරුවන්ට පානීය ජලය නිසි ලෙස ලබා දීමේ වැඩපිළිවෙළක් යෙදීම, ආබාධිත දරුවන්ට පිවිසුම් මාර්ග සැකසිය යුතු වීම, අධ්‍යාපනය ලබාදෙන ගුරුවරයාගේ සුදුසුකම් පිළිබඳව තක්සේරුව පිළිබඳව ආදි කරුණු මෙහි අන්තර්ගත වී නොමැති අතර ඒව අන්තර්ගත වීම අනිවාර්ය බවත්, ඒ අනුව මෙම අතුරු ව්වස්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කිරීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය ගරු බන්දුලසේන මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ ආකාරයට ආබාධිත දරුවන් සඳහා ප්‍රවේශ මාර්ගයක් ලබා දීම උපකාරක පන්තියකට අවශ්‍ය බවත්, එම කාරණය මෙම අතුරු ව්‍යවස්ථාව තුළ අට වැනි පරිච්ඡේදයේ ප්‍රවේශ මාර්ග තිබිය යුතුය යන කාරණයට අන්තර්ගත කළ හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා මෙම අතුරු ව්‍යවස්ථාව අප බලප්‍රදේශයේ සියයට සියයක් නිවැරදිව ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගික නොවන බවත්, මෙය සම්මත කර තබා ගනු ලබන්නේ ඉතා අවිධිමත් ආකාරයෙන් උපකාරක පන්ති ආරම්භ වුවහොත් ඒ සඳහා නීතියානුකූලව කටයුතු කිරීමට බවත්, ප්‍රකාශ කරන ලදී.

ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් පෞද්ගලික අධ්‍යාපන ආයතන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව අනුමත කිරීම සඳහා වූ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මිත විය

**03. විජයපුර පාසල් මාවත සකස් කර ගැනීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා විජයපුර පාසල් මාවත "කාපට් මාර්ගය කිලෝමීටර් ලක්ෂයේ වැඩසටහන" යටතේ සංවර්ධන කටයුතු ආරම්භ කර ඇති අතර වර්තමානය වන විට මෙහි වැඩ කටයුතු නවතා ඇති බවත්, විජයපුර බණ්ඩාරනායක මාවත සිට විජයපුර ධම්මතිලක විදුහල දක්වා ඇති තාර දැමූ මාර්ග කොටස මේ වන විට ගමන් කිරීමට අපහසු තත්ත්වයට ම වලවල් සෑදි අබලන් වී ඇති නිසා පාසලට පැමිණෙන වාහන පවා ආපදාවට ලක් වන අවස්ථා පවතින බවත් මේ සඳහා අවධානය යොමුකර, පාරේ පවතින එම වලවල් වලට බොරළු දමා ගමන් කිරීමට සුදුසු තත්වයට පත් කර දෙන ලෙසට ප්‍රදේශවාසීන් ඉල්ලා සිටින බවත්, ප්‍රකාශ කරන ලදී. මෙම පාර සේම කිරි කඩේ පාර ද මේ වන විට අබලන් තත්වයක පවතින බවත්, කොන්ත්‍රාත් පදනම මත මේවා සකස් කිරීමට ලබාදී ඇති නිසා මැදිහත්වීමක් සිදුකළ නොහැකි

වුවත්, ජනතාවගේ ගමනාගමන අපහසුතාවය පිළිබඳ සැලකිල්ලට ගෙන සහා අරමුදලින් යම් පිරිවැයක් යොදා ගමන් කිරීමට සුදුසු ආකාරයට සකස් කර දීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා ව්‍යාපෘති කාලය අවසන් වී නොමැති නම් මෙම පාරවල් පිළිසකර කිරීම සඳහා අපට මැදිහත් විය නොහැකි බවත්, මන්ද යම් අවස්ථාවකදී කොන්ත්‍රාත්කරුවන් මෙය සකස් කිරීමට පටන් ගත් විට නැවත මුල් තත්ත්වයේ තිබිය යුතු බව ප්‍රකාශ කළහොත් වියදම් දෙකක් දැරීමට සිදුවන බවත්, එමනිසා කොන්ත්‍රාත්කරුවන් සමග සාකච්ඡා කර තීරණයක් ගතයුතු බවත්, නාච්චාදූව රත්මලේ මාර්ගයේද මෙවැනි ගැටලුකාරි තත්ත්වයක් නිසා අනතුරු ද සිදු වී ඇති බවත්, ඒ සඳහා ද යම් ක්‍රියාමාර්ගයක් ගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා මාර්ග වල පවතින්නාවූ එම ගල්ම යොදා ගනිමින් සංවර්ධනය සිදු නොකළ යුතු බවත්, මීත් පෙර අවස්ථාවකදී එතුමන්ගේ කොට්ඨාශයේ කිලෝ මීටර් එකයි මීටර් 700 ක මාර්ගයක් සංවර්ධනය කිරීම සඳහා මිහින්තලා මාර්ගයේ ගල්වළවල් දෙකකින් තමා විසින් බොරලු ලෝඩ් ලබාදුන් බවත්, දින 10 කින් මුදල් ලබාදීමට පොරොන්දු වුවත්, අද වන තෙක් කිසිඳු මුදලක් ඒ සඳහා ගෙවා නොමැති බවත්, JCB යන්ත්‍රයේ මුදල් ද එතුමන් ලබාදුන් බවත්, ගරු සභාපතිතුමා ටද මේ පිළිබඳව දැනුම් දුන්නත් කිසිදු ගෙවීමක් සිදු නොකළ බවත්, පොලිසියේ පැමිණිල්ලක්ද මේ සම්බන්ධයෙන් පවතින බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා මැදිහත්වීමක් සිදුකළ නොහැකි වන්නේ, මෙය කොන්ත්‍රාත්කරුවන් විසින් අත්සන් කල ඇති මාර්ගයක් වන නිසා බවට ප්‍රකාශ කරන ලදී

ගරු මන්ත්‍රී එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා මේ මාර්ගය පමණක් නොව තවත් මාර්ග වල මේ ආකාරයෙන් සංවර්ධනය සිදු කළ යුතු බවත්, නමුත් මෙවැනි ආකාරයේ සංවර්ධනයක් සිදු කිරීමේදී අදාල කොන්ත්‍රාත්කරුවන් දැනුවත් කළ යුතු බවත්, ඔවුන් දැනුවත් නොකර එවැනි සංවර්ධනයක් සිදු කළ නොහැකි බවත් එම නිසා කොන්ත්‍රාත් කරුවන් සමග සාකච්ඡා කර මේ සඳහා විසඳුමක් සෙවිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා සතියේ දින පහ තුළම මම මාර්ග ඔස්සේ වාහන ගමන් කරන බවත්, වර්තමානයේ පවතින තත්ත්වය මත මෙම මාර්ගවල ගමන් කිරීම ඉතා අපහසු බවත්, ඒවායේ පවතින වළවල් වසා දැමීම සඳහා අවම වශයෙන් බොරලු දමා හෝ පිළිසකර කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ඒකපාර්ශ්විකව ගිවිසුම් වලංගු කිරීම සුදුසු නොවන බවත්, ඒ මාර්ග පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ සම්බන්ධයක් පවතින්නෙ නම්, ඒ පිළිබඳව දැනුවත් කර මාර්ග සංවර්ධන අධිකාරියෙන් මේ සඳහා විකල්පයක් ලබාගත යුතු බවත්, අනෙක් මාර්ගයන් ගිවිසුම්ගත වී පවතින ස්වෙච්ඡා සංවිධාන සමග ද ගිවිසුම් අවලංගු නොකර ඔවුන් සමග ගැටුම් ඇති කර නොගෙන මේ සඳහා විකල්පයක් ලබාගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා මාර්ග සංවර්ධනය කිරීමේදී අදාල කොන්ත්‍රාත්කරුවන් සමග නිශ්චිත දිනකට වැඩ නිමකිරීම සඳහා ගිවිසුම් ගත වී ඇති නිසා ඔවුන් එම දිනට වැඩ නිම නොකලේ නම් දෙසැම්බර් 31 වන විට ඒවා අසාදු ලේඛණයට ඇතුළත් කළ යුතු බවත්, ඒවා සඳහා ක්‍රියා මාර්ගයක් ගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම මෙම යෝජනාවේදී ඇස්තමේන්තුවක් සකස් කර අනුමත කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා රටේ පැවති තත්වය හමුවේ එම මාර්ග සංවර්ධනය කිරීමේ දී ගැටලු ඇති වුණු නිසා අදාළ කාලය ඉක්මවා ගිය බැවින් ඒවා අසාදු ලේඛන ගත කිරීම නුසුදුසු බවත් ප්‍රකාශ කරන ලදී. මෙම තත්වය හමුවේ කොන්ත්‍රාත්කරුවන්ට සේම අපටද අසාධාරණයක් සිදුවී ඇති බවත් , දෙපාර්ශ්වයටම

සිදුවූ මෙම අසාධාරණය නිසා මෙම යෝජනාවට අනුව ගමන් කිරීමට හැකිවන සේ මම මාර්ග පිළිසකර කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් විජයපුර පාසල් මාවත හා කිරිකඩේ මාර්ගය සකස් කර ගැනීම අනුමත කිරීම සඳහා වූ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය

**04. තෝරාගත් ශිෂ්‍යාවක් සඳහා ක්‍රීඩා උපකරණ ලබා ගැනීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා</u> අනුරාධපුර,අනුලාදේවි මාවත, අංක418, නිවසේ පදිංචි ටී එච් ප්‍රියංගනි යන ශිෂ්‍යාව කේ.බී. රත්නායක මහා විද්‍යාලයේ 11 ශ්‍රේණියේ ඉගෙනුම ලබන අතර , ඇය ක්‍රීඩාවට දක්ෂ දැරියක් වන අතර ඇය දිස්ත්‍රික් ක්‍රිකට් කණ්ඩායමට ද තේරී පත් වී ඇත. නමුත් ඇයගේ පවුල් ආර්ථිකය තුල පවතින අපහසුතා මත පුහුණුවීම් වලට අවශ්‍ය ක්‍රීඩා උපකරණ ලබා ගැනීමේ අපහසු තාවක් පවතින නිසා ඇයට අවශ්‍ය පහත සඳහන් ක්‍රීඩා උපකරණ ලබා ගැනීමට ඉල්ලා සිටින බවත් ප්‍රකාශ කරන ලදී.

අවශ්‍ය ක්‍රීඩා උපකරණ:-Bat,Ball,Shoes,Ball guard,Glouse.Pads.Tie pad,Arm guard,Head guard

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> ක්‍රීඩාවට දක්ෂ ළමයෙක් නිසා ක්‍රීඩාවට සහාය දිය යුතු බැවින්, ඇය දිස්ත්‍රික් කණ්ඩායමට තේරී පත්වූ එම සහතිකය තහවුරු කිරීම මත ක්‍රීඩා උපකරණ ලබාදීම සුදුසු බවට ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා</u> ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් තෝරාගත් ශිෂ්‍යාවකට ක්‍රීඩා උපකරණ ලබා ගැනීම සඳහා වූ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**05. ආසියාතික තරුණ සේවා සම්මේලනය සඳහා ආරාධනා ලත් ගරු ගයාන් චාමර මන්ත්‍රීතුමා හට ඒ සඳහා සහභාගිවීමට සහා අරමුදලින් ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා අනුමැතිය ලබාගැනීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා</u> ගරු ගයාන් චාමර මන්ත්‍රීතුමා මීට පෙර අවස්ථා දෙකකදීම ආසියාතික තරුණ සේවා සම්මේලනය සඳහා සහභාගී වී ඇති අතර මෙවර එම ආසියාතික තරුණ සේවා සම්මේලනය මැලේසියාවේ පවත්වන අතර , ඒ සඳහා එතුමන් හට සහභාගි වීමට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන සභා අරමුදලින් යොමු කිරීම සඳහා වූ යෝජනාව ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා</u> මීට පෙර අවස්ථා දෙකකදී මේ සඳහා සම්බන්ධ වී ඇති බවත්, නමුත් මෙම අවස්ථාවේදී ලංකාවේ පවතින ආර්ථික තත්ත්වය මත ඒ සඳහා සම්බන්ධ වීම ප්‍රතික්ෂේප කරන බවත් ප්‍රකාශ කරන ලදී.

**06. ජාතික යොවුන් සේනාංක මාවතට බිම් ඇතිරුම් ගල් ලබා ගැනීම සඳහා.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා</u> අනුරාධපුර ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන පිවිසුම් මාර්ගය මේ වන විට අබලන් තත්වයේ පවතින අතර එම පිවිසුම් මාර්ගය වර්ෂාව පවතින දිනයන්හි පුහුණුලාභීන් හා කාර්ය මණ්ඩලයට ගමන් කිරීමට අපහසු තත්වයට පත් වන හෙයින් කඩිනමින් පිරිස කර කිරීමට අවශ්‍යව ඇති බවත්, එම නිසා එම මාර්ගය බිම ඇතුරුම් ගල් යොදා පිළිසකර කිරීමට යෝජනා කොට ඇති අතර ඒ සඳහා ප්‍රාදේශීය සභාව මඟින් දැනට භාවිතයේ නොමැති ව නොමැති ව ඉවත් කොට ඇති බිම් ඇතුරුම් ගල් අවශ්‍ය ප්‍රමාණයක් ලබා දීමට කටයුතු සලසන මෙන් ඉල්ලා සිටින බවත් ප්‍රකාශ කරන ලදී.

<u>ගරු උප සභාපති එම්.සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> එම මාර්ගයේ මීටර් දෙසීයක් පමණ මේ ආකාරයෙන් ගල් ඇතිරීමට පවතින බවත්, මේ සඳහා අප ප්‍රාදේශීය සභාවෙන් ඉවත් කරන ලද ඉන්ටලොග් ගල් පවතී නම් අප

ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ නිලධාරී නිලධාරී තුමන්ගේ අධීක්ෂණයට යටත්ව ඒවා ලබාදීමට සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා යොවුන් සේනාංකය සඳහා ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය මගින් විශාල මුදල් ප්‍රමාණයක් ලැබෙන බවත්, එම දරුවන්ගේ කුසලතාව සඳහා ආධාරයක් කලත් සංවර්ධන කටයුතු සඳහා අපට මැදිහත් වීමක් වීමක් සිදුකළ නොහැකි බවත්, ප්‍රාදේශීය සභාව සතුව පවතින එම ඉවත් කරන ලද ඉන්ටලොග් ගල් මගින් අප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ සුබසිද්ධිය සඳහා යෙදීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු උප සභාපති එම්.සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයට මේ සම්බන්ධයෙන්, ප්‍රාදේශීය සභාව මැදිහත්වීමෙන් ලිඛිතව ඉල්ලීමක් කිරීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

**07. ප්‍රාදේශීය සභාවේ පුස්තකාලයන් වෙත පොත් මිලදී ගැනීම සම්බන්ධව.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා සාහිත්‍ය මාසයට සමගාමීව කොළඹ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පවතින ජාතික පොත් ප්‍රදර්ශනය තුලින් නැගෙනහිර නුවරගම් පලාත ප්‍රාදේශීය සභාවට අයත් මහජන පුස්තකාල තුන සඳහා අවශ්‍ය පොත් මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය පුස්තකාල සඳහා පොත් මිලදී ගැනීමට ගෙන ආ මෙම යෝජනාව ස්ථිර කරන බවත්, මීට පෙර අස්ථානගත වූ පොත් සඳහා ක්‍රියාමාර්ගයක් ගෙන තිබේ ද යන්න විමසන අතර , පුස්තකාල සමීක්ෂණයක් සිදු කර එම අස්ථානගතවූ පොත් සම්බන්ධයෙන් මිල ගනන් සහිතව ගරු මහා සභාවට වාර්තාවක් ලබා දෙන ලෙසට ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා මේ වන විට බොහෝ නිවෙස් තුළ පාවිච්චි නොකරන ලද පුස්තකාල සඳහා අවශ්‍ය පොත්පත් පවතින බවත් ඒවා ස්වේච්ඡාවෙන් ලබාදීම සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම සුදුසු බවත් ඒ සඳහා සතියක පමණ කාලයක් ලබාදී එම පොත් ලබා ගැනීම සඳහා තමා යෝජනාවක් කරන බවත් පවසන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා පුස්තකාලයන් සඳහා පොත් ලබා ගැනීමට මෙතරම් මුදලක් යෙදවීම නිශ්ඵල බවත්, මෙවැනි මුදලක් යොදවා දරුවන්ට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සුදුසු බවත්, පොත් ලබා මිලදී ගන්නේ නම් දරුවන්ගේ අධ්‍යාපනය සඳහා අවශ්‍ය වන විෂය නිර්දේශයන්ට අදාල පොත් මිලදී ගැනීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

_ අප ප්‍රාදේශීය සභාව සතු පුස්තකාල තුළ මේ වන විට බොහෝ පොත් ප්‍රමාණයක් පවතින බවත්, අලුතෙන් පොත් මිලදී ගන්නේ එම පැවති පොත් ඉවත් කළ නිසාවෙන් ද යන්න සොයා බැලිය යුතු බවත් පවසන ලදී.

ගරු මන්ත්‍රී එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා පුස්තකාල සඳහා පොත් ලබා ගැනීම සම්බන්ධයෙන් ගරු කුමාරසිංහ මන්ත්‍රීතුමා සිදු කළ යෝජනාව සත්‍ය බවත්, වර්තමානයේ පොත් මිල වැඩිවීම මත වාර්තාවේ සඳහන් මිල ගණන් යටතේ පොත් ලබා ගැනීමේදී ගැටලු ඇති වන බවත් , විෂයානුබද්ධ පොත් පත් නිරන්තරයෙන් වෙනස් වන නිසා ජීවිතයට වැදගත් කමක් ලබා දෙන පොත්පත් මිලදී ගැනීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා මෙම පොත් මිලදී ගැනීමට අදාළව වාර්තාව සකස් කරන ලද්දේ පුස්තකාලාධිපති තුමිය ඇතුළුව එහි කාර්ය මණ්ඩලය බවත්, ඔවුන් පුස්තකාල සතුව පවතින පොත් පිළිබඳව අපට වඩා දැනීමක් පවතින බවත් , පුස්තකාල සඳහා සඳහා වරින් වර පොත් මිලදී ගැනීම අවශ්‍ය බවත් පවසන ලදී ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ප්‍රාදේශීය සභාවේ පුස්තකාලයන් වෙත පොත් මිලදී ගැනීම සඳහා වූ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය

## 08. LDSP ව්‍යාපෘතියේ ගම්මිරිස් ආදර්ශ වගාව සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා LDSP ව්‍යාපෘතියේ මගින් යෝජිත උත්පාදිත ආදායම් වැඩිකර ගැනීමේ හා දේශීය ආහාර නිශ්පාදනයට රුකුලක් වන ආකාරයෙන් හෝ විදේශ විනිමය උත්පාදිත ව්‍යාපෘති යෝජනා කිරීම යන වශයෙන් අප වෙත දන්වා ඇති වැඩපිළියෙල යටතේ සැලසුම් කළ මෙම යෝජනාව ඉදිරිපත් කරන බවත්, ඒ අනුව එක් තුලානකට අක්කර 5 බැගින් වන ලෙසට ගම්මිරිස් වගාව ප්‍රචලිත කිරීම සඳහා මූලික පියවරක් ලෙස ආදර්ශ ගොවිපලක් නිර්මාණය කිරීමට වැඩපිළිවලක් යොදා ඇති බවත් ඒ අනුව එම තෝරා ගත් ආදර්ශ ගොවිපල සිදු කරන ගොවි මහතාට අවශ්‍ය කොම්පෝස්ට් පොහොර හා ඇල්බීසියා කෝටු ප්‍රාදේශීය සභා අරමුදලින් ලබා දීමට මෙම යෝජනාව තුලින් ඉදිරිපත් කරන බවත් පවසන ලදි.

ගරු මන්ත්‍රී එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා මෙම ව්‍යාපෘතිය යටතේ ආදර්ශ ගොවි පළක් ඇති කිරීම ඉතා හොඳ යෝජනාවක් බවත්, මෙම ව්‍යාපෘතිය තවදුරටත් පුළුල් කරමින් ආදර්ශ ගොවිපළවල් කිහිපයක් නිර්මාණය කිරීම සුදුසු බවත් පවසන ලදී.

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය ගරු සභාපතිතුමා විසින් ගෙන ආ ගම්මිරිස් වගාව ප්‍රචලිත කිරිමේ ව්‍යාපෘතියට පෙර ආදර්ශ ගම්මිරිස් වගා ගොවිපලක් ඇති කිරීම සඳහා වූ යෝජනාව ස්ථීර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් LDSP ව්‍යාපෘතියේ ගම්මිරිස් ආදර්ශ වගාව සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා වූ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

## 09. අතුරුවැල්ල එළ ගව මස් කඩයේ වාරික මුදල් සම්බන්ධව.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා අප ප්‍රාදේශීය සභාවට අයත් අතුරුවැල්ල එළ ගවමස් කඩය කුසව, නාවිවදුව පදිංචි එම්. ජලීල් යන අයට 2022 වර්ෂයට බදු පදනම මත ලබා දී ඇති අතර 2021.01.25 දින සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් ගවමස් අලෙවි සැල් වසංගත රෝගී තත්වය හේතුවෙන් තාවකාලිකව වසා දමන ලෙස දන්වා ඇති අතර මෙම ගව මස් අලෙවිසැල නැවත විවෘත කරන ලෙස සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් 2022.05.24,දින දන්වා ඇති අතර මෙම වසා තබන ලද කාලසීමාවට අදාළව වාරික මුදල් කපා හරින ලෙසට ඉල්ලීමක් සිදුකර ඇති බව ප්‍රකාශ කරන අතර එම මුදල කපා හැරීම සිදු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදි.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා ගරු සභාපතිතුමා විසින් ගෙනා යෝජනාව ස්ථීර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් අතුරුවැල්ල එළ ගව මස් කඩයේ වාරික මුදල් සම්බන්ධව සිදු කළ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

## 10. නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කිලෝමීටර් එකක් දෙපස කැළය හා කාණු කපා මාර්ගයේ දෙපස නියමිත පරිදි සකස් කිරීම හා පැල සිටුවීම.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති වාර්තාව තුල පහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇත

- මාර්ග රක්ෂිතයේ පවතින සාමාන්‍ය ප්‍රමාණයේ කැලේ කපා පිළිස්සීම,වට ප්‍රමාණය මිලි මීටර් 300 ට අඩු ගස් කපා මුල් ගලවා ඉවත් කිරීම.
- මිනිස් ශ්‍රමයෙන් සාමාන්‍ය පසෙහි කාණු කපා එම පස් මාර්ගයෙන් ඉවත් කිරීම.

- මාර්ගයේ දෙපස මීටර් 50ක දුරින් 600×600×600 මී.මී. ප්‍රමාණයේ වල කපා කොම්පෝස්ට් පොහොර යොදා උස මිලිමීටර නවසීය වන පැල සිටුවා මාස තුනක් යනතෙක් ජලය දමා නඩත්තු කිරීම. ( කුඹුක්, වීර, පලු ,ඇහැළ, කරඳ, මී) විදුලි රැහැන් යට සිටුවීම සඳහා රණවරා පැලය යොදා ගත යුතුවේ.මෙම පැළ සඳහා 750x750x1200 ආවරණයක් යොදා ගතයුතු වේ. ( මේ සඳහා ගිනිසීරියා දඬු හෝ උණ යොදා ගැනීම ප්‍රමාණවත් වේ.

ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා ගරු සභාපතිතුමා විසින් ගෙන ආ මාර්ග දෙපස සුද්ද කර පැළ සිටුවීමට සම්බන්ද යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා මේ සඳහා පැල තෝරා ගැනීමේදී මිනිස්සුන්ට ප්‍රයෝජනවත් වන පැල තෝරා ගත යුතු බවත්, ඒ සඳහා දිවුල්, බෙලි, මී, බෙහෙත් නෙල්ලි ආදී පැල වැඩිපුර වගා කිරීම සුදුසු බවත් පවසන ලදී. එමෙන්ම පැළ ලබාගැනීම සඳහා යන වියදම අවම කිරීමට අප විසින්ම පැල සාදාගත හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා මෙම ව්‍යාපෘති වාර්තාවට අනුව පැල සිටුවීමේ දුර 50m න් 50 mලෙස සඳහන් වී ඇති බවත්, එය අඩි පනහෙන් පනහ ලෙසට සංශෝධනය විය යුතු බවත් පවසන ලදී. එමෙන්ම මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී විජයපුර මංසන්ධියේ සිට මල්වතු ඔය දක්වා මාර්ගය සභාව විසින් සිදුකරමින් ආදර්ශයක් ලබා දීම සුදුසු බවත්, එහිදී මාර්ගය දෙපස එලිපෙහෙලි කිරීමේදී මීටර් එකක් පමණක් නොව නිවෙසෙහි වැටවල් දක්වාම වල් ඉවත් කර එලිපෙහෙලි කිරීම සුදුසු බවත්, ස්වේච්ඡා සංවිධානය සමඟ ගිවිසුම්ගත වී මෙය සිදු කිරීම යහපත් බව හා එහිදී ප්‍රාදේශීය මන්ත්‍රීවරයාගේ අධීක්ෂණය යටතේ සිදුකළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කිලෝමීටර් එකක් දෙපස කැළය හා කාණු කපා මාර්ගයේ දෙපස නියමිත පරිදි සකස් කිරීම හා පැල සිටුවීමට සිදු කළ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**ඊ) කාරක සභාවල වාර්තා**

- 2022 සැප්තැම්බර් මස 08 වන දින මුදල් කමිටු වාර්ථාව සභා ගත කරන ලදී.

**එ) ලැබීම් ගෙවීම් මාසික වාර්තා**

2022 ජූලි මස ආදායම් හා වියදම් වාර්ථා මහ සභාවේ සලකා බැලීම සිදු කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ගෙවීම් වාර්ථා වල පරිපාලන වියදම්, සේවක වැටුප්, මන්ත්‍රී දීමනා හැර අනෙකුත් ගෙවීම් සඳහා තමන් විරුද්ධ බව ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා පසුගිය සභා වාරයකදී විදුලිය ඉතිරි කිරීම යටතේ වීදි පහන් අක්‍රිය කිරීම නුසුදුසු නිසා යම් වීදි පහනක් අක්‍රිය වුවහොත් නැවත අලුත්වැඩියාවක් සිදු නොකරන බවට යෝජනාවක් ගෙන ආ අතර එය ගරු මහා සභාවේ සම්මත වූ බවත් නමුත් මෙම ගෙවීම් වාර්ථා වලට අනුව වීථි පහන් අලුත්වැඩියා කිරීම සඳහා මුදල් යොදවා ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා එම යෝජනාවට අනුව ඉදිරිපත් කළේ නව වීදි පහන් සවි නොකරන බවට පමණක් බවත්, වීදි පහන් අලුත්වැඩියා කිරීම නොකරනවා යනුවෙන් ප්‍රකාශ නොකළ බවත් පවසන ලදී.

**ඒ) රැස්වීම් කැඳවීමේ දැන්වීම් හා වෙනත් කාරණා ඉදිරිපත් කිරීම.**

**01. නිවාඩු දැනුම් දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු මන්ත්‍රී එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය,ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා,ගරු මන්ත්‍රී, පී.ටී සිරිසේන මැතිතුමා , ගරු මන්ත්‍රී ජී.ඒ නෙළුම් මැතිනිය, ගරු මන්ත්‍රී ,කේ. හැරිසෙන්ස් මැතිතුමා, ගරු මන්ත්‍රී වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා මහ සභාවට නොපැමිණෙන බවට දන්වා යොමු කර තිබූ නිවාඩු ඉල්ලීම් මහ සභාවට ඉදිරිපත් කරන ලදී.

ගරු උප සභාපති එම්.සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා අදාල නිවාඩු ඉල්ලුම් කර ඇති ගරු සභිකවරුන් වෙත නිවාඩු ලබා දීම සුදුසු බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා කුඩා නෙළුබැව නගරය තුල තවත් වැව් මාළු ලැල්ලක් ස්ථාපිත කිරීම සඳහා තමන් යෝජනාවක් කරන බවත්, ඒ සඳහා වර්තමානයේ දී වැව් මාළු ලැල්ල පවත්වාගෙන යන පුද්ගලයාගේ කිසිදු විරෝධතාවයක් නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ශ්‍රාවස්තිපුර ත්‍රීරෝද රථ ගාල අසලට ජලය ලබා ගැනීමට ජල කරාමයක් සවිකර සවි කර දීමට තමන් යෝජනා කරන බවට ප්‍රකාශ කරන ලදී. බ්ලොග් ගල් මැෂිම මිල දී ගැනීමේ වර්තමාන තත්ත්වය විමසන ලදි.

ගරු මන්ත්‍රී ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිනිය කුඩා නෙළුබැව පාසල් භූමියේ පවතින ළිඳ මේ වන විට භාවිතා කිරීමට අපහසු තත්ත්වය පවතින අතර එම ලිද ඉස පිළිසකර කළ දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා කුඩා නෙළුබැව නගරයේ තවත් වැව් මාළු ලැල්ලක් ස්ථාපිත කිරීම සඳහා වර්තමානයේ වැව් මාළු ලැල්ල පවත්වාගෙන යන පුද්ගලයාගේ විරුද්ධත්වයක් නොමැති බවට ලිඛිතව ඉදිරිපත් කරන ලෙසට පවසන ලදී. එමෙන්ම ශ්‍රාවස්තිපුර තීරෝද රථ ගාල අසලට ජල කරාමයක් දැමීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව හා කුඩා නෙළුබැව පාසලේ ලිඳ ඉස පිළිසකර කළ කළ දෙන ලෙසටත් පවසන ලදී.

ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා තීන්දු තීරණ ගැනීම වෙනුවෙන් ගෞරවයෙන් සහයෝගය දැක්වූ ගරු මන්ත්‍රීතුමන්ලා වෙත හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත ස්තුතිය ප්‍රකාශ කරමින් 2022.09.16 වන දින පැවැත්වූ මහ සභා රැස්වීම ප.ව 11.45 ට අවසන් කරන ලද අතර එළබෙන මහ සභාව 2022.10.18 වන දින පෙ.ව 10.00 පැවැත්වෙන බව සඳහන් කරන ලදී.

....................................

ලේකම්,
නැ. නු. ප ප්‍රාදේශීය සභාව,
විජයපුර.

..........................................

එස්. බී කුමාරදාස,
සභාපති ,
නැ. නු. ප්‍රාදේශීය සභාව,
විජයපුර.